# දහනව වන සියවසේ සිංහල බෞද්ධ පුනරුදයේ පෙරගමන්කරුවන් වූ බෞද්ධ පුවත්පත් සහ සඟරා

සුමනා අමරසිංහ[1]

හෙළ බොදු පුවත්පත් සහ සඟරා වර්තමාන සමාජයේ ද ජනමත කාරකයෙක් ලෙස ජන විඥානය හසුරවන ප්‍රබල මාධ්‍යකි. ඉන් සිදුවන ප්‍රබල සංස්කෘතික බලපෑම මෙන්ම භාෂාත්මක බලපෑම ද අතිමහත් ය. සිංහල බෞද්ධ සඟරා හා පුවත්පත් වල ඓතිහාසික විකාශනය බ්‍රිතාන්‍ය යුගය පුරා අධ්‍යයනය කිරීම මෙම පත්‍රිකාවේ අරමුණකි. එසේම හෙළ බොදු ජාතික මාමක ව්‍යාපාරයට මේ තුළින් සිදුවූ දායකත්වය විමර්ශනය කිරීමද තවත් අරමුණකි.

1832 වර්ෂයේ පුවත්පත් ලියාපදිංචි වූ තැන් සිට 1862 සිංහල පුවත්පත් ලියාපදිංචි වීම පාදක කොට ක්‍රි.ව. 1948 වර්ෂයේ මහා බ්‍රිතාන්‍යයයෙන් නිදහස අර්ධ වශයෙන් හෝ ලබනතුරු පළවූ සියළුම පුවත්පත් හා සඟරාවල නාමාවලියත් පුවත්පත් සුචියත් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම පුවත්පත් හා සඟරා මගින් දේශපාලන ආර්ථික හා සමාජයීය හා සංස්කෘතික වශයෙන් සිදුවූ බලපෑම පිළිබඳව ද සියුම් අධ්‍යයනයක් ඉදිරිපත් කිරීමට නියමිතය. එසේම හෙළ බොදු පුවත්පත් හා සඟරාවන්හි අන්තර්ගතය, භාෂාව, රූ රටා සහ සැකැස්ම පිළිබඳව විධිමත් සමාලෝචනයක් ද කෙරෙනු ඇත.

**ප්‍රමුඛ පදඃ** බෞද්ධ පුවත්පත්, සිංහල සඟරා, අන්තරගතය විග්‍රහය

**Title:** Buddhist newspapers and periodicals in Sinhala as pioneers of the 19th century Buddhist revival

**Keywords:** Sinhala Buddhist newspapers, Sinhala periodicals content analyses

---

[1] රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ 07